වාර්ෂික වාර්තාව 2021

2021 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹුවන

ශ්‍රී ලංකා ආර්ථිකය, අභියෝග සහ ඉදිරි දැක්ම

ආචාර්ය ලසිත පත්බේරිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වර්ෂය සඳහා වන මෙම වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි හැත්තෑ දෙවන වාර්ෂික වාර්තාවයි

මුදල් නීති පනතෙහි 35වන වගන්තිය:

... සෑම මුදල් වර්ෂයක් අවසාන වීමෙන් පසුව මාස හතරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ තත්ත්වය ද, එම මුදල් වර්ෂය තුළ මුදල් මණ්ඩලය මගින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ සමාලෝචනයක් සහ මෙම ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හේතු වූ ආර්ථික හා මූල්‍ය තත්ත්වයන්ගේ විශ්ලේෂණයක් ද ඇතුළත් වාර්ෂික වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම මුදල් මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ...

වාර්ෂික වාර්තාවේ පෙළගැස්ම...

I වන වෙළුම	I කොටස	-	ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ප්‍රතිපත්ති සහ ගැටලු සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය
II වන වෙළුම	II කොටස	-	ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු
	III කොටස	-	මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන
	IV කොටස	-	2021 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත්

I කොටස - ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ප්‍රතිපත්ති සහ ගැටලු...

1. ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති
2. ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය
3. ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්
4. මිල සහ වැටුප්
5. විදේශීය අංශයේ ප්‍රවණතා හා ප්‍රතිපත්ති
6. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු
7. මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය
8. මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව

මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ඉතිහාසයේ කිසිදා අත් නොවිඳි මට්ටමේ පීඩාකාරී තත්ත්වයකට පත්ව ඇත...

- අවම මට්ටමේ නිල සංචිත
- ඇතැම් විදේශීය ණය ගෙවීම් නවතා ඇත
- ඉහළ උද්ධමනය
- විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම
- ඉතා අඩු රාජ්‍ය මූල්‍ය අවකාශය
- ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන බලශක්ති අර්බුදය
- සමාජ හා දේශපාලන නොසන්සුන්තාව

මුදල් නීති පනතේ අවශ්‍යතාවයක් වන 2021 මහ බැංකු වාර්ෂික වාර්තාවෙහි ප්‍රධාන වශයෙන් 2021 වසරේ කාර්යසාධනය ඇතුළත් වේ...

වාර්ෂික වාර්තාව 2021

1 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

2021 වසර සහ 2022 වසරේ මුල් කාලයේ දී
ශ්‍රී ලංකා ආර්ථිකය සංක්ෂිප්තයක් ලෙස...

ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය, 2021 වසරේ වසංගතයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය විය...

මූර්ත ආර්ථිකය 2021 වසරේ දී යථා තත්ත්වයට පත් විය...



සේවා වියුක්තිය 5.5 % 2020 → 2021 5.1 %

ශ්‍රම බලකා සහභාගීත්වය 50.6% 2020 → 49.9% 2021

උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...

- 29.8% මතුපිට උද්ධමනය (අප්‍රේල් - 2022)
- 46.6% ආහාර කාණ්ඩයේ උද්ධමනය (අප්‍රේල් - 2022)
- 22.0% ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය (අප්‍රේල් - 2022)



විදේශීය අංශය පෙර නොවූ ආකාරයේ අභියෝගවලට අඛණ්ඩව මුහුණ දුණි...

ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය ...

2020	2021
එ. ජ. ඩොලර් බිලියන 1.2	එ. ජ. ඩොලර් බිලියන 3.3

එ. ජ. ඩොලර් බිලියන 12.5 අපනයන

එ. ජ. ඩොලර් බිලියන 20.6 ආනයන

වෙළඳ හිඟය වැඩි විය...

2020	එ. ජ. ඩොලර් බිලියන 6.0
2021	එ. ජ. ඩොලර් බිලියන 8.1



විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය...

දළ නිල සංචිත අඩු විය...

2020	2021
එ. ජ. ඩොලර් බිලියන 5.7	එ. ජ. ඩොලර් බිලියන 3.1

රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය සැලකියයුතු ලෙස දුර්වල විය...

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)

සමස්ත අයවැය ශේෂය	වර්තන ගිණුමේ ශේෂය	ප්‍රාථමික ශේෂය
-12.2% (2021)	-7.7% (2021)	-6.0% (2021)
-11.1% (2020)	-7.9% (2020)	-4.6% (2020)

මධ්‍යම රජයේ ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)

- 86.9% 2019
- 100.6% 2020
- 104.6% 2021

රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම සහ රාජ්‍ය වියදම ඉලක්කගත මට්ටම ඉක්මවා යෑම හේතුවෙන් අයවැය හිඟය තවදුරටත් දුර්වල වී ඇති අතර රාජ්‍ය ණය තොගය ඉහළ ගොස් ඇත...

ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම පහළ දමා ඇත..

මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම 2021 අගෝස්තු මස ආරම්භ විය...



- ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික: ↑ පදනම් අංක 900 *(2021 අගෝස්තු සිට)*
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය: ↑ පදනම් අංක 200
- තෝරාගත් දේශීය ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉහළ නැංවීම/ඉවත් කිරීම

ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් දක්වා අඩු වූ වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යෑම ආරම්භ විය...





ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ඉදිරි ගමන්මග : 2022 සහ ඉන් ඉදිරියට

මූර්ත අංශය

- ආර්ථික වර්ධනය නැවත නිවැරදි මාවතකට යොමු කිරීම සඳහා සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩපිළිවෙළක් අවශ්‍ය වේ
- මනාව ඉලක්ක කළ සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම

විදේශීය අංශය

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ආර්ථික ගැලපුම් වැඩසටහනක් සඳහා යොමු වීම
- විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම
- මූල්‍ය හිඟයන් පියවා ගැනීම සඳහා මූල්‍යන සපයා ගැනීමේ විකල්ප ක්‍රම වෙත යොමු වීම
- විනිමය අනුපාතිකය, අධික විචලනයකින් තොරව, නම්‍යශීලීව පවතින බවට සහතික වීම
- ණය නොවන විදේශ විනිමය ලැබීම් වැඩිදියුණු කිරීම

වත්මන් අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඒකාබද්ධ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති අවශ්‍ය වේ

රාජ්‍ය මූල්‍ය අංශය

- ආදායම් වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග සහ වියදම් සීමා කිරීම හා ප්‍රමුඛතා හඳුන්වාදීම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම
- රාජ්‍ය ණය තිරසාරභාවය ළඟා කර ගැනීම
- රජය සතු වාණිජ ව්‍යාපාරවල ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

මුදල් හා මූල්‍ය අංශය

- මිල ස්ථායීතාව නැවත ලඟා කර ගැනීම සඳහා සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම
- මහ බැංකුව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය ක්‍රමානුකූලව අඩු කිරීම
- මහ බැංකු ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම
- මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම

වාර්ෂික වාර්තාව 2021

2,3 සහ 4වන පරිච්ඡේද

ශ්‍රී ලංකා මහ බැංකුව

ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය,

ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

හා

මිල සහ වැටුප්

ශ්‍රී ලංකා ආර්ථිකය වසංගත තත්ත්වයේ දැඩි බලපෑම් හේතුවෙන් 2020 වසරේ දී වාර්තා කළ පසුබෑමෙන් පසුව, 2021 වසරේ දී වර්ධනයක් වාර්තා කළේය...

ආංශික වර්ධන වේගය (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දැනට දළ දේශීය නිෂ්පාදිතයෙ හි පදනම් වර්ෂය වෙනස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර සංශෝධිත දත්ත නුදුරේ දී ලබා දීමට නියමිතය.

කෘෂිකර්මාන්ත අංශය:

ඉහළ යාම:
- තෙල් සහිත පලතුරු භෝග වගාව
- සත්ත්ව නිෂ්පාදන
- තේ වගාව
- කුළුබඩු වගාව
- වන වගාව හා දැව

පහළ යාම:
- වී වගාව
- පලතුරු වගාව
- එළවළු වගාව

කර්මාන්ත අංශය:

ඉහළ යාම:
- රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය
- ආහාර සහ බීම වර්ග නිෂ්පාදනය
- රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය
- ඉදි කිරීම්

පහළ යාම:
- අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය
- මලාපවහන කටයුතු සහ කසළ කළමනාකරණය

සේවා අංශය :

ඉහළ යාම:
- මූල්‍ය සහ මූල්‍ය අතරමැදි සේවාවන්
- තොග සහ සිල්ලර වෙළඳාම
- දේපළ වෙළඳාම් කටයුතු
- සෞඛ්‍ය සේවා කටයුතු

ආර්ථික කටයුතු	වාර්ෂික වර්ධන අනුපාතිකය %	
	2020	2021
කෘෂිකර්මාන්තය, වනවගාව සහ ධීවර	-2.2	2.0
කර්මාන්ත	-6.9	5.3
සේවා	-1.6	3.0
භාණ්ඩ මත බදු අඩු කිරීම සහනාධාර	-8.1	4.9
ද.දේ.නි.	**-3.6**	**3.7**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දළ අගය එකතු කිරීමට දක්වන දායකත්වය



- **කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා කටයුතු යන ප්‍රධාන ආර්ථික කටයුතු ත්‍රිත්වයම 2021 වසරේ දී වර්ධනය විය**

2021 වසරේ දී ආයෝජන සහ පරිභෝජන වියදම් වර්ධනය වූ අතර ශුද්ධ විදේශීය ඉල්ලුම දුර්වල විය...

- වියදම් ප්‍රවේශය යටතේ පවත්නා වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය අනුව
  - 2020 වසරේ දී 4.2%ක සංකෝචනයක් වාර්තා කළ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.නි.යෙන් 27.7%කි), 2021 වසරේ දී 23.2%කින් ඉහළ ගියේය
  - භාණ්ඩ හා සේවා අපනයනවලට සාපේක්ෂව ආනයන සඳහා පැවති ඉහළ වර්ධනය පිළිබිඹු කරමින්, භාණ්ඩ හා සේවා සඳහා වූ ශුද්ධ විදේශීය ඉල්ලුම 31.6%කින් සංකෝචනය විය
  - කෙසේ වෙතත්, පරිභෝජන වියදම් (ද.දේ.නි.යෙන79.9%කි), 2020 වසරේ වාර්තා කරන ලද 2.0%ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී 9.9%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය

- ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්, 2020 වසරේ දී වාර්තා වූ 18.7%ට සාපේක්ෂව, 2021 වසරේ දී 20.1%ක් විය

- දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්, 2020 වසරේ දී වාර්තා කරන ලද 23.6% සිට 23.8% දක්වා, 2021 වසරේ දී සුළු වශයෙන් වර්ධනය විය
  - ආයෝජනවල වර්ධනයට වඩා ජාතික ඉතුරුම්වල සංසන්දනාත්මක අඩු වර්ධනය හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2020 වසරේ දී වාර්තා වූ -1.6% සිට 2021 වසරේ දී -3.9%ක් දක්වා වැඩි විය

ඉතිරිකිරීම්, ආයෝජන සහ ඉතුරුම්-ආයෝජන පරතරය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) (අ)



(අ) ද.දේ.නියෙහි ඇස්තමේන්තු මත පදනම්ව (පදනම් වර්ෂය 2010)

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

බලශක්ති ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන්හි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතිණි....

- බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය පෙර වසරේ පැවති ඩොලර් 43.35ට සාපේක්ෂව, 2021 වසරේ දී ඩොලර් 70.80 දක්වා 63.3%කින් වර්ධනය විය. 2008 වසරෙන් පසු වැඩිම බ්‍රෙන්ට් බොරතෙල් මිල වාර්තා වූයේ 2022 වසරේ මාර්තු මාසයේදී ය
- වසර එකහමාරකට වැඩි කාලයකට පසුව 2021 වසරේ දී රජය විසින් ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් ඉහළ දැමීම සඳහා ගෝලීය බොර තෙල් මිල ගණන් අඛණ්ඩව ඉහළ යෑම හේතු විය.
- වසර තුළ දී, දේශීය වෙළෙඳපොළ තුළ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය 7.7% කින් පහත වැටුණි





- 2021 වසරේ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමග විදුලිබලය සඳහා වූ ඉල්ලුම අඛණ්ඩව ඉහළ ගියේය
- 2021 වසර තුළ දී, විදුලි බල උත්පාදනය ගි.වො.පැ 16,716ක් දක්වා 6.4%කින් වර්ධනය විය
- වසර තුළදී, අඩු පිරිවැයක් සහිත ජල විදුලි බල උත්පාදනය මත වැඩි වශයෙන් රඳා පැවති අතර, වැඩි පිරිවැයක් සහිත ද්‍රව ඉන්ධන පදනම් කරගත් විදුලි බල උත්පාදනය මත වන රැඳියාව අඩු විය
- ජල විදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ යෑම, 2021 වසර තුළ ලං.වි.ම.යේ මූල්‍ය කාර්ය සාධනය ඉහළ නැංවීමට උපකාරී වී ඇති නමුත්, වසර තුළ මෙන්ම පසුගිය කාලය තුළ සිදු වූ අලාභ පියවා ගැනීමට මෙය ප්‍රමාණවත් නොවීය

වසංගතයට පෙර පැවති මට්ටම් ඉක්මවා ගිය මෙහෙයුම් ක්‍රියාකාරකම් මට්ටම් වාර්තා කරමින් 2021 වසරේ දී වරාය ක්‍රියාකාරකම්වල සමස්ත කාර්යසාධනය ශීඝ්‍ර ලෙස යථා තත්ත්වයට පත් විය...



වසර තුළ දී කොළඹ වරායේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වඩාත් ස්ථාවර ලෙස අඛණ්ඩව සිදු විය

- නැ.බ.ප.යෙහි දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ කළේය
- බ.බ.ප. සඳහා ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, අයිතිය පැවරීම පදනම් කර ගත් ගිවිසුමක් (**Built-Operate-Transfer agreement**) වසර 35ක කාලයක් සඳහා අත්සන් කරන ලදී
- නැ.බ.ප. සහ බ.බ.ප. යෙහි ඉදිකිරීම් කටයුතු පිළිවෙළින්, 2025 සහ 2026 වන විට නිම කිරීම හරහා කොළඹ වරායේ ධාරිතාව අඩි විස්සේ බහලු ඒකක මිලියන 6කින් ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ

බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්



වරාය ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරීත්වය



මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් තුළ කොළඹ වරාය අඛණ්ඩව ඉහළ ස්ථානයන්හි ශ්‍රේණිගත විය

- බහාලුම් වරාය කාර්ය සාධන දර්ශකය – **17** වන ස්ථානය
- වරායයන් සඳහා වූ නිශ්චිත නාවික ගමනා ගමන සම්බන්ධතා පිළිබඳ දර්ශකය – **17** වන ස්ථානය

කොවිඩ්-19 ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා සෞඛ්‍ය අංශය මූලිකත්වය ගෙන කටයුතු කළ අතර අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය මංගත අධ්‍යාපන ක්‍රමය 'නව සාමාන්‍යකරණ' තත්වයට අනුගතවිණ...

ගෝලීය වශයෙන් පිළිගත් එන්නත් වැඩසටහන



ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහනෙහි තත්ත්වය (2022.04.05 වන දිනට)

1 මාත්‍රාව (වසර 12 ඉක්මවූ ජනගහණයෙන්)	2 මාත්‍රාව (වසර 12 ඉක්මවූ ජනගහණයෙන්)	වර්ධක මාත්‍රාව (පූර්ණ එන්නත්කරණය ලක්වූ ජනගහණයෙන්)
97%	82%	55%

- සමස්ත සමාජ ආර්ථික යහපැවැත්ම සහතික කිරීම සඳහා අවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාව පවත්වාගෙන යෑමට පහසුකම් සලසමින්, වෛරසය පැතිරීම පාලනය සඳහා රජය සුපරීක්ෂාකාරීව කාලීන හා සුදුසු සංචරණ සීමා කිරීම් අනුගමනය කළේය.
- 2021 වසරේ දී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වුවද, ගෝලීය වශයෙන් පිළිගත් එන්නත්කරණ වැඩසටහන ක්‍රියාවට නැංවීමත් සමඟ ශ්‍රී ලංකාවට රෝගීන් සංඛ්‍යාව අවම කරගැනීමට හැකිවිය.

පාසල් වරින් වර වසාදැමීම හේතුවෙන් කොවිඩ්-19 වසංගතයේ අභියෝග ජය ගනිමින් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යෑම සඳහා විවිධ නව ක්‍රමවේද අනුගමනය කිරීමට අවශ්‍ය විය.



දැනටමත් පවතින විෂමතා තවදුරටත් පුළුල් වීමත් සමඟ, දිළිඳුකම තුරන් කරලීම සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වී ඇත...

දරිද්‍රතාවයට අදාළ බහුවිධ මානයන්ට අනුව දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දුප්පත් වන අතර දරිද්‍රතාවයෙන් පෙළෙන ජනකොට්ඨාසය, දිස්ත්‍රික්ක අතර සැලකිය යුතු මට්ටමේ විෂමතාවයක් සහිතව බර තැබූ එම බහුමාන දර්ශකවලට අනුව සාමාන්‍යයෙන් 42%ක් පමණ වන විහිනතාවයක් අත්දකින බව අනාවරණය වේ...

පවතින සියලුම සමාජ ආරක්ෂණ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යන අතරතුර ජනගහනයේ අවදානමට ලක්වියහැකි කණ්ඩායම් ඉලක්ක කරගනිමින් සමාජ ආරක්ෂණ පියවර කිහිපයක් රජය ආරම්භ කළේය...

බහුමාන දරිද්‍රතා දර්ශකය
දිස්ත්‍රික් මට්ටමේ දත්ත-2019



රජය විසින් අවස්ථා දෙකක දී අවදානමට ලක්වියහැකි පවුල් සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලබාදෙන ලදී

රු. බිලියන 22.3

එක් පවුලකට රුපියල් 2,000 බැගින් වූ දීමනාවක්ද ලබාදෙන ලදී

(රජය විසින් ලබාදෙන කිසිදු දීමනා වැඩසටහනකින් ආධාර නොලබන පවුල් ඉලක්ක කරගනිමින්)

රු. බිලියන 11.8

ප්‍රධාන සුබසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම

වර්ෂය	දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන		පෝෂණ දීමනා වැඩසටහන (අ)		වියළි සලාක වැඩසටහන
	පවුල් සංඛ්‍යාව (ආ)	වටිනාකම (රු. මිලියන) (ඇ)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආ)	වටිනාකම (රු. මිලියන)	වටිනාකම (රු. මිලියන)
2017	1,388,242	39,707	372,407	5,408	84
2018	1,384,021	39,239	329,047	5,490	58
2019	1,800,182	44,660	300,246	5,279	105
2020	1,770,086	52,434	238,034	4,761	ලැ.නො.
2021	1,760,485	55,400	250,848	5,248	ලැ.නො.

(අ) ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සඳහා
(ආ) වසර අවසානයේ දී
(ඇ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
මුදල් අමාත්‍යාංශය

පොදු මිල මට්ටම, 2021 වසර තුළදී සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, වසර අවසාන කාලපරිච්ඡේදයේ දී කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා කළේය...

- ජාත්‍යන්තර වෙළඳපොළෙහි ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමවල මිල ඉහළ යෑම්, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු වැඩි වීම්, අභ්‍යන්තර සැපයුම් ජාල තුළ ඇති වූ අවහිරතා, විවිධ මිල සංශෝධන හරහා ඇති වූ සෘජු සහ වක්‍ර බලපෑම් සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය සාර්ථකව පාලනය කිරීමත් සමඟ ඉල්ලුම ඉහළ යෑම දේශීය අයිතමවල මිල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය
- පොදු මිල මට්ටමේ ඉහළ යෑම සඳහා ආහාර කාණ්ඩය තුළ ඇතුළත් නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට අයත් අයිතමවල මිල විචලනයන් වැඩිම දායකත්වයක් දක්වන ලදී
- 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය
- නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල හැර අනෙකුත් ආහාර අයිතමවල මිල 2021 වසර තුළදී අඛණ්ඩව ඉහළ ගියේය
- ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2021 වසර තුළදී අඛණ්ඩව ඉහළ ගිය අතර, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී එම ඉහළ යෑමේ වේගය තවදුරටත් ශීඝ්‍ර විය

2021 වසරේ දී විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ යෑමක් පෙන්නුම් කරන ලදී...

- අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2021 වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය
- පඩි පාලක සභා මගින් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී 74.4%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය
- රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී නොවෙනස්ව පැවතුණි

2021 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව



(ඇ) නාමික සහ මූර්ත වැටුප් වෙනස ලෙස 2021 සහ 2020 වසරවල සාමාන්‍ය අතර ප්‍රතිශතමය වෙනස දක්වා ඇත.

(ඈ) පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වේ.

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී බොහෝ ශ්‍රම වෙළඳපොළ දර්ශකවල වර්ධනයක් දක්නට ලැබුණ ද ශ්‍රම වෙළඳපොළ පූර්ව වසංගත මට්ටමට තවමත් ළඟා වී නොමැත...

- ශ්‍රම බලකාය, 2020 වසරේ වාර්තා වූ මිලියන 8.467 සිට 2021 වසරේ දී මිලියන 8.553ක් දක්වා ඉහළ ගියේය
- ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය, 2020 වසරේ වාර්තා වූ 50.6% සිට 2021 වසරේ දී 49.9% දක්වා පහළ ගියේය

පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය:	71.9% → 71.0%	ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය:	32.0% → 31.8%

- සේවා නියුක්ත ජනගහනය 2020 වසරේ වාර්තා වූ මිලියන 7.999 සිට 2021 වසරේ දී මිලියන 8.114ක් දක්වා ඉහළ ගියේය. සේවා නියුක්තිය ඉහළ යෑම සඳහා කෘෂි කාර්මික හා සේවා කටයුතුවලට අදාළ රැකියා අවස්ථා ඉහළ යෑම හේතු විය

සේවා නියුක්ති දායකත්වය	2020	2021
කෘෂිකාර්මික	27.1%	27.3%
කර්මාන්ත	26.9%	26.0%
සේවා	46.0%	46.7%

- සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරේ වාර්තා වූ 5.5% සිට 2021 වසරේ දී 5.1%ක් දක්වා පහළ ගියේය

සේවා වියුක්ති අනුපාතිකය (%)



ශ්‍රම වෙළඳපොළ දර්ශක

ශ්‍රම බලකාය	ආර්ථික වශයෙන් සක්‍රීය [illegible] ජනගහනය	ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය	සේවා නියුක්ත ජනගහනය	සේවා වියුක්ති අනුපාතිකය	විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්
මිලියන 8.467 (2020)	මිලියන 8.273 (2020)	50.6% (2020)	මිලියන 7.999 (2020)	5.5% (2020)	53,711 (2020)
මිලියන 8.553 (2021)	මිලියන 8.581 (2021)	49.9% (2021)	මිලියන 8.114 (2021)	5.1% (2021)	121,795 (2021)

වාර්ෂික වාර්තාව 2021

5 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

මූලිකවම වෙළඳ හිඟයෙහි පුළුල් වීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අඩු වීම පිළිබිඹු කරමින් 2021 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය සැළකිය යුතු ලෙස ඉහළ ගියේය...

අපනයන, ආනයන සහ වෙළඳ හිඟය (එ.ජ.ඩොලර් බිලියන)





- **මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් සඳහා, චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 810ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්, 2021 වසරේ අගෝස්තු මාසයේ දී ජා.මූ. අරමුදලෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 787ක් පමණ වූ වි.ගැ.හි. වෙන් කිරීම, සහ විදේශීය සෘජු ආයෝජන (ණය ඇතුළුව) ලෙස වූ එ.ජ. ඩොලර් මිලියන 784ක ලැබීම් අන්තර්ගත වේ**
- ප්‍රධාන ගෙවීම් සඳහා, රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන ගෙවීම සහ 2021 වසරේ ජූලි මාසයේ දී කල් පිරුණු එ.ජ.ඩොලර් බිලියන 1ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයෙහි පියවීම් ඇතුළත් විය.

වාර්තාගත අපනයන වර්ධනය ඉක්මවා ආනයන සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් විය...

- අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 12,499ක වාර්තාගත ඉහළ අගයක් දක්වා 24.4%කින් ඉහළ ගියේය.
  - සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල ආදායම ඉහළ ගියේය.
- අපනයන ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ:
  - රෙදිපිළි හා ඇඟලුම් (22.9%)
  - රබර් නිෂ්පාදිත (33.6%)
- අපනයන පහළ යෑම වාර්තා වූයේ:
  - පුද්ගලික සනීපාරක්ෂක උපකරණ සඳහා වන ඉල්ලුම අඩු වීම හේතුවෙන් ප්ලාස්ටික් හා උපාංගවල (-55.4%)
- අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාව ඉහළ යෑම සැලකිය යුතු ලෙස දායක විය.

2021 වසරේ දී භාණ්ඩ වෙළඳාම

(එ.ජ.ඩො. බිලියන)



2021 වසරේ දී වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් වීමට:

- වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම
- ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත් වීම
- එන්නත් වැනි ඖෂධීය අයිතම සඳහා වූ ආනයන වියදම ඉහළ යෑම
- ආනයන මත පනවා තිබූ ඇතැම් සීමා ලිහිල් කිරීම

- ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 20,637ක් දක්වා 28.5%කින් ඉහළ ගියේය:
  - සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩවල වියදම ඉහළ ගියේය.
- ආනයන ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ:
  - ඉන්ධන (47.2%)
  - රෙදිපිළි හා උපාංග (31.3%)
- ආනයන පහළ යෑම් වාර්තා වූයේ:
  - පොහොර (-38.9%)
  - බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (48.2%)
- ආනයන වියදම් වැඩිවීම සඳහා ආනයන පරිමාව හා ආනයන මිල ගණන් යන දෙඅංශයම හේතු විය.

විදේශ විනිමය ලැබීම් සීමා වීම සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ දළ නිල සංචිත පහළ ගියේය...

ගෙවුම් තුලනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2020 වසරේ දී මෙන්ම 2021 වසරේදී ද සමස්ත ශේෂය හිඟයක් වාර්තා කළේය

දළ නිල සංචිත

2021 : එ.ජ.ඩොලර් බිලියන 3.1 (ආනයනික මාස 1.8)

2020 : එ.ජ. ඩොලර් බිලියන 5.7 (ආනයනික මාස 4.2)

2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය තත්ත්වය ඉහළ ගියේය...

විදේශීය ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මුළු විදේශීය ණය ප්‍රමාණය

2021 වසර අවසානයේ දී : එ.ජ. ඩොලර් බිලියන 50.7 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 60.0%)

2020 වසර අවසානයේ දී : එ.ජ. ඩොලර් බිලියන 49.0 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 60.5%)

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

2021 : එ.ජ. ඩොලර් බිලියන 4.5

2020 : එ.ජ. ඩොලර් බිලියන 4.6

2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මුළු විදේශ ණය තත්ත්වය ප්‍රධාන වශයෙන් වැඩි වීමට හේතු වූයේ,

- චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක් ලැබීම
- චීන මහජන බැංකුව සහ බංගලාදේශ බැංකුව සමඟ නව ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට එළඹීම
- වසර තුළ දී සෘජු ආයෝජන ව්‍යාපාර කිහිපයක් වෙත අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ලැබුණු බැවින්, සෘජු ආයෝජන ව්‍යාපාරවල අන්තර් සමාගම් ණය ඉහළ යෑම
- මුදල් හා තැන්පතුවල සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය වැඩි වීම

2021 වසරේ දී ස්ථායී මට්ටමක පවත්වා ගත් විනිමය අනුපාතිකය, විදේශීය අංශයේ මතුවන ගැටලු සලකා බලමින් මහ බැංකුව විසින් 2022 වසරේ මාර්තු මස මුල සිට ක්‍රමානුකූල ගැලපීමක් සඳහා ඉඩ හරින ලදී...

- **දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සීමිත විදේශ ව්‍යවහාර මුදල් ද්‍රවශීලතාවක් පැවතීම හේතුවෙන්, විශේෂයෙන්ම 2021 වසරේ පළමු මාස හතර තුළ දී, ශ්‍රී ලංකා රුපියල යම් උච්චාවචනයක් සමඟින් අවප්‍රමාණය වීමේ පීඩනයක් පෙන්නුම් කළේය.**
- **තවද, මහ බැංකුව 2021 වසරේ දී, ශුද්ධ පදනම මත, එ.ජ. ඩොලර් මිලියන 747ක් සපයමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සඳහා මැදිහත් විය.**
- **ශ්‍රී ලංකා රුපියලෙහි අඛණ්ඩ විදේශීය තරඟකාරීත්වය පිළිබිඹු කරමින්, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, 2021 වසරේ දී පදනම් වර්ෂයේ සීමාවට (2017=100) පහළින් පැවතුණි**
- **දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ දක්නට ලැබුණු ඉහළ පීඩනය හේතුවෙන්, විනිමය අනුපාතිකය තීරණය කිරීමේදී වැඩි නම්‍යශීලීභාවයකට ඉඩ සැලසීමෙන් පසු, විනිමය අනුපාතිකය සැලකිය යුතු ඉහළ ප්‍රමාණයකින් අවප්‍රමාණය විය.**

එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය



සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100)
මුදල් වර්ග 24 පැස අනුව



වාර්ෂික වාර්තාව 2021

6 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම ඓතිහාසිකව වාර්තා වූ පහළම අගය දක්වා පහත වැටුණි...

- රජයේ ආදායම, නාමික වශයෙන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත **6.5%**කින් වර්ධනය වුවද, එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, **2020** දී වාර්තා වූ **9.1%** සිට **2021** වසරේ දී **8.7%**ක් දක්වා අඩු විය

- ලිහිල් බදු තන්ත්‍රයක් අඛණ්ඩව පවත්වාගෙන යාම
- බාහිර අංශයේ පීඩනය ලිහිල් කිරීමට පනවා ඇති ආනයන සීමා කිරීම
- ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වීම හේතුවෙන්

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම සහ බදු ආදායම පහත වැටුණි

රාජ්‍ය ආදායමේ සංයුතිය - 2021



මූලය: මුදල් අමාත්‍යාංශය

රාජ්‍ය ආදායම පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රුපියල් මිලියන		
බදු ආදායම	**1,216,542**	**1,298,019**
ආදායම් බදු	268,249	302,115
එකතු කළ අගය මත බදු	233,786	308,213
නිෂ්පාදන/සුරා බදු	321,932	306,861
ආනයන මත බදු	114,183	64,339
අනෙකුත් බදු	278,392	316,490
බදු නොවන ආදායම	**151,417**	**159,052**
මුළු ආදායම	**1,367,960**	**1,457,071**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ)		
බදු ආදායම	**8.1**	**7.7**
ආදායම් බදු	1.8	1.8
එකතු කළ අගය මත බදු	1.6	1.8
නිෂ්පාදන/සුරා බදු	2.1	1.8
ආනයන මත බදු	0.8	0.4
අනෙකුත් බදු	1.9	1.9
බදු නොවන ආදායම	1.0	0.9
මුළු ආදායම	**9.1**	**8.7**

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මූළු වියදම සහ ශුද්ධ ණය දීම්, 2020 වසරේ දී වාර්තා වූ 20.2% සිට 2021 වසරේ දී 21.0%ක් දක්වා ඉහළ ගියේය...

- මූළු වියදම සහ ශුද්ධ ණය දීම්, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 3,041.0 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 3,521.7ක් දක්වා රුපියල් බිලියන 480.7කින් ඉහළ ගියේය
- වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යෑම පිළිබිඹු කරමින්, පුනරාවර්තන වියදම් 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 2,548.4ට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 2,747.5ක් දක්වා ඉහළ ගියේය
- පුනරාවර්තන වියදම්, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී වාර්තා වූ 17% සිට 2021 වසරේදී 16.3% දක්වා පහළ ගිය අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 2020 වසරේදී වාර්තා වූ 3.3% හා සසඳන විට 2021 වසරේදී 4.6%ක් දක්වා ඉහළ ගියේය

රාජ්‍ය පුනරාවර්තන වියදම් සංයුතිය - 2021



2021 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් දුර්වල වූ අතර, අයවැය හිඟය මූල්‍යකරණය දේශීය මූලාශ්‍ර හරහා සපුරා ගන්නා ලදී...

- ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය, 2020 වසරේ දී වාර්තා වූ 11.1% (රුපියල් බිලියන 1,667.7) සිට 2021 වසරේ දී 12.2%ක් (රුපියල් බිලියන 2,057.9ක්) දක්වා වැඩි විය
- ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වර්තන ගිණුමේ හිඟය, 2020 වසරේ දී වාර්තා වූ 7.9%ට (රුපියල් බිලියන 1,180.4ට) සාපේක්ෂව සැලකිය යුතු වෙනසක් නිරූපණය නොකරමින් 2021 වසරේ දී 7.7%ක් (රුපියල් බිලියන 1,290.4ක්) වශයෙන් වාර්තා විය
- ප්‍රාථමික ශේෂයේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී වාර්තා වූ 4.6%ට (රුපියල් බිලියන 687.4ට) සාපේක්ෂව, 2021 වසරේ දී 6.0%ක් (රුපියල් බිලියන 1,009.5ක්) දක්වා දුර්වල විය

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධන කර ඇත.

මූලය: මුදල් අමාත්‍යාංශය



මධ්‍යම රජයේ නොපියවූ ණය 2021 වසරේ දී ගැටලුකාරී ලෙස ඉතා ඉහළ මට්ටමකට වැඩි විය...

- **2021 වසරේ දී ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම්වල ඉහළ යෑම හේතුවෙන් නාමික වශයෙන් සමස්ත ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 2,375.6ක් දක්වා 22.4%කින් ඉහළ ගියේය**
- **2020 වසර අවසානයේ ද.දේ.නි.යෙන් 100.6%ක් වූ මධ්‍යම රජයේ නොපියවූ ණය, 2021 වසර අවසන් වන විට ද.දේ.නි.යෙන් 104.6%ක් දක්වා වැඩි විය**

මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මධ්‍යම රජයේ නොපියවූ ණය



වාර්ෂික වාර්තාව 2021

7 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

මහ බැංකුව 2021 වසරේ අගෝස්තු මාසයේ සිට සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම ආරම්භ කළේය...

ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණවල සහ මෙහෙයුම් ඉලක්කයේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- කොවිඩ්-19 වසංගතයේ රැළි ගණනාවක බලපෑම අවම කිරීම සඳහා සුවිශේෂී මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණය 2021 වසරේ පළමු භාගය තුළදී ද අඛණ්ඩව පවත්වාගෙන යෑම අවශ්‍ය විය
- රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මහ බැංකුව විසින් සැලකිය යුතු ප්‍රමාණයක භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම මගින් රජය වෙත මූල්‍යමය සහාය ලබා දෙන ලදී

- ආර්ථිකයේ දක්නට ලැබුණු ඇතැම් අසමතුලිතතා, විශේෂයෙන් ඉල්ලුම් පීඩන ඇති වීම සහ විදේශීය අංශයෙහි හා දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ ඇති වූ පීඩන දක්නට ලැබීම
- මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික 2021 වසරේ අගෝස්තු මස මැද දී පදනම් අංක 50 බැගින් ඉහළ නංවන ලදී. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද 2021වසරේ සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිශතාංක 2කින් 4.0%ක් දක්වා ඉහළ නංවන ලදී

- විදේශීය අංශයේ අඛණ්ඩව පවතින පීඩන මෙන්ම ලිහිල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය මධ්‍යයේ උද්ධමනය අපේක්ෂිත මට්ටම්වලට වඩා ඉහළ යෑමත් සමග 2021 වසරේ අගෝස්තු මාසයේ සිට අනුගමනය කළ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2022 වසරේදී වඩාත් දැඩි විය

එවැනි උද්ධමන පීඩනවල බලපෑම්වලට මුහුණ දීමේ අවශ්‍යතාවය හඳුනාගෙන සහ අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම වැළැක්වීම සඳහා 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික සමස්තයක් ලෙස පදනම් අංක 850කින් ඉහළ නංවන ලදී

ඉල්ලුම් සහ සැපයුම් යන දෙඅංශවල ප්‍රවණතා හේතුවෙන්, 2021 වසරේ දී උද්ධමනය ඉහළ ගියේය...

වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනයේ හැසිරීම



වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයේ හැසිරීම



- කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2021 වසර අවසානය වන විට 12.1%ක් දක්වා ඉහළ ගිය අතර, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී **29.8%**ක් විය
- සැලකිය යුතු මුදල් ලිහිල්කරණයේ පසු කාලීන බලපෑම පිළිබිඹු කරමින් මූලික උද්ධමනය ද, 2021 වසරේ දෙවන භාගයේ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් මනිනු ලබන උද්ධමන අපේක්ෂා, පවතින උද්ධමන ප්‍රවණතාවල බලපෑම පිළිබිඹු කරමින් 2021 වසරේ දී ඉහළ මට්ටමක පැවතුණි

දැඩි මුදල් සහ ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යමින් පවතී...

භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකවල සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම



පොලී අනුපාතික	2020 අවසාන යේදී	2021 අගෝස්තු 18 වැනි දිනට	2021 අවසාන යේදී	2022 මැයි 06 වැනි දිනට	2020 අවසානයේ සිට 2021 අවසානය දක්වා	2021 අගෝස්තු 18 වැනි දින සිට මේ දක්වා	2021 අවසානයේ සිට මේ දක්වා
	%	%	%	%	පදනම් අංකවල වෙනස	පදනම් අංකවල වෙනස	පදනම් අංකවල වෙනස
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය	4.55	5.09	5.95	14.50	140	941	855
දින-91 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය	4.69	5.33	8.16	23.48	347	1438	1155
දින-182 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය	4.80	5.34	8.33	23.85	353	1739	1440
දින-364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය	5.05	5.32	8.24	23.92	319	1804	1512
බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය- සතිපතා	5.81	5.71	8.61	19.55	280	473	183
බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය- මාසික	5.74	5.70	8.33	13.02	259	377	114
බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය	10.29	9.45	9.87	10.35	-42	68	26
බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය	8.38	8.09	9.48	10.73	110	198	59
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය	5.80	4.77	4.94	5.52	-86	40	23
බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය	7.14	5.67	5.94	6.84	-120	63	36
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය	4.93	4.99	6.45	7.68	152	151	5
බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය	5.08	5.15	6.67	8.06	159	160	8

2021 වසර තුළ දී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, රජයේ ඉහළ ගිය අරමුදල් අවශ්‍යතාව දේශීය බැංකු පද්ධතියෙන් විශාල වශයෙන් සපුරා ගන්නා ලදී...

දේශීය ණයෙහි වාර්ෂික ඉහළ යෑම



පෞද්ගලික අංශයට ලබා දුන් ණය | රජයට ලබා දුන් ශුද්ධ ණය | රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය 2021 වසරේ දී රුපියල් බිලියන 810.5කින් ඉහළ ගියේය

රාජ්‍ය අංශයට ලබා දුන් ණය ප්‍රසාරණය (වාර්ෂික වෙනස්වීම, රුපියල් බිලියන)

- 2021 වසර තුළ දී මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,225.2කින් ඉහළ ගියේය
- දුර්වල මූල්‍ය තත්ත්වය සහ දිගු කාලීනව පවතින ගැටලු පිළිබිඹු කරමින්, රජය සතු වාණිජ ව්‍යාපාර, බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2021 වසර තුළ දී අඛණ්ඩව ඉහළ ගියේය

බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම හේතුවෙන් 2021 වසර අවසානය වන විට පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය මන්දගාමී විය...

පුළුල් මුදල්වල (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක (වත්කම් අනුව)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික වාර්තාව 2021

8 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව

2021 වසරේ දී බැංකු අංශය මධ්‍යස්ථ වේගයකින් ප්‍රසාරණය විය...

- පොලී ආදායමෙහි, පොලී නොවන ආදායමෙහි ඉහළ යෑම සහ පොලී වියදම් වල පහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ ලාභදායීත්වය පෙර වසරට සාපේක්ෂව වර්ධනය විය
- ප්‍රධාන වශයෙන්, ණය හා අත්තිකාරම් සහ ආයෝජනවල වර්ධනය හේතුවෙන් බැංකු අංශයේ වත්කම් පදනම වර්ධනය විය
- 2021 වසර තුළ සාපේක්ෂ වශයෙන් ණය සහ අත්තිකාරම් ඉහළ වර්ධනයක් පෙන්වීම හේතුවෙන්, දළ අක්‍රීය ණය අනුපාතය අඩු විය
- සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම, ප්‍රේෂණ ඉපැයීම්වල අඩු වීම, අපනයන ආදායම්වල පරිවර්තනය මන්දගාමී වීම, ආනයන වියදම් වැඩි වීම සහ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම පහත වැටීම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතාවය දැඩි බලපෑමකට ලක්විය

	දළ අක්‍රීය ණය අනුපාතය (%)	ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය- දේශීය බැංකු මෙහෙයුම් අංශය (%)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)
2021	4.5	33.8	16.5
2020	4.9	37.8	16.5

බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක





බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය 2021 වසර තුළ වර්ධනය විය...

- ණය වර්ධනය සහ ලාභදායීත්වය හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.
- පොලී වියදම් පහළ යෑම සහ පොලී නොවන ආදායම ඉහළ යෑම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය වර්ධනය විය.
- දළ අක්‍රිය ණය අනුපාතය පෙර වසරට සාපේක්ෂව පහත ගොස් තිබුණ ද, මෙම අංශයේ ශුද්ධ අක්‍රිය ණය අනුපාතය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි.
- මෙම අංශය අවම නියාමන අවශ්‍යතාවලට වඩා හිතකර ප්‍රාග්ධන හා ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින් ස්ථාවරව පැවතිණි



බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ අංශයේ අක්‍රිය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්



බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ අංශයේ ලාභදායීත්ව දර්ශක



අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක ගැටලු මගින් රටේ **ආර්ථික අපේක්ෂා** යටපත් කර ඇති අතර, **තිරසාර සාර්ව ආර්ථික ස්ථායිතාව** සහ **ආර්ථිකයේ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන** වර්ධනයක් සහතික කිරීම සඳහා එම ගැටලුවලට කඩිනමින් පිළියම් යෙදිය යුතුය...

ගැටලු සහ ප්‍රතිපත්ති...

01

භාණ්ඩ හා සේවා අපනයනවලින් ලැබෙන ශුද්ධ ගලා ඒම් ඉහළ නැංවීමෙන් මෙන්ම සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම තුළින් **ජංගම ගිණුමේ තිරසාර ශේෂයක්** සාක්ෂාත් කර ගැනීම, විදේශීය අංශයේ අසමතුලිතතා මගින් පැන නගින **උග්‍ර අවදානම් තත්ත්වයන්** මඟහරවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

02

ඉහළ විදේශ විනිමය ණය සේවාකරණ අවශ්‍යතා සහ ණය ආපසු ගෙවීම සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය අඩු වීම හමුවේ **විදේශීය අංශයේ ස්ථාවරත්වය** සහතික කිරීම සඳහා විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට ඉදිරියේදී **ණය නොවන විදේශ මූල්‍ය ලැබීම් ආකර්ෂණය කර ගැනීම** දැඩි අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

03

කොළඹ වරාය නගරය ව්‍යාපෘතිය තුළින් ආර්ථිකයට **ලැබිය හැකි ප්‍රතිලාභ ප්‍රශස්ත මට්ටමින්** අත්කර ගැනීම සඳහා **අපේක්ෂිත විදේශීය සෘජු ආයෝජන ලැබීම් කඩිනම් කිරීමට** ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

ගැටලු සහ ප්‍රතිපත්ති...

04 පසුගිය වසර කිහිපය තුළ **අඛණ්ඩව ආදායම් රැස්කිරීම අඩු වීම** රාජ්‍ය මූල්‍ය අංශය දුර්වලව පැවතීමට සහ සාර්ව ආර්ථික අසමතුලිතතාවන්ට මූලික වශයෙන් හේතු වී ඇති නිසා, **ආදායම් රැස් කිරීම සඳහා තිරසාර ක්‍රියාමාර්ග යොදා ගැනීමේ** ඇඩි අවශ්‍යතාව පෙන්නුම් කෙරේ.

05 රජයේ **මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක** සාක්ෂාත් කර ගැනීම රඳා පවතින්නේ, රජයේ අරමුණු හා ගැළපෙන, නිතර වෙනස් නොවන, **මැනවින් සම්බන්ධීකරණය කළ සහ සාක්ෂි මත පදනම් කර ගත්** ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම මතය.

06 ආයෝජකයින්, ණය හිමියන් සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන සඳහා ගැටලු මතු කරමින්, පසුගිය දශක කිහිපය පුරා රාජ්‍ය අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් **මධ්‍යම රජයේ ණය ප්‍රමාණය තියුණු ලෙස ඉහළ යෑම** රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රධාන ගැටලුවක් ලෙස තවදුරටත් පවතී.

07 කොවිඩ්-19 වසංගතය නිසා රටේ ආර්ථිකයේ ඇති වූ පසු බෑසීමත් සමඟ කටයුතු කරන අවස්ථාවක, ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම උදෙසා, ගුණාත්මක බව සහ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් **රාජ්‍ය අංශයේ සේවා සැපයීම** වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව පෙරට වඩා තීරණාත්මක සාධකයක් බවට පත් වී ඇත.

08 මූල්‍යනය සඳහා විකල්ප මූලාශ්‍ර හඳුනා ගැනීම මෙන්ම, බැංකු පද්ධතියෙහි මූල්‍ය ශක්තිය වැඩි දියුණු කිරීමට හැකිවන පරිදි දිගු කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හරහා මූල්‍ය පහසුකම් ලබාගැනීමේදී **රාජ්‍ය අංශය විසින් මහ බැංකුව ඇතුළු බැංකු පද්ධතිය මත අධික ලෙස රඳා පැවතීම** අඩු කළ යුතුය.

09 **ආහාර උද්ධමනය** නිසා ඇතිවන සාමාන්‍ය මිල මට්ටම් නිරන්තර උච්චාවචනය වීම සහ එය යම් කාලයක් ඒකාකාරීව පැවතීම නිසා **උද්ධමනය ඉලක්කගත පරාසය තුළ පවත්වා ගැනීමට** සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට මහ බැංකුව දරන උත්සාහයන් දුර්වල කරන බැවින් කාලෝචිත සහ තිරසාර පදනමක් මත රජයේ මැදිහත් වීම මගින් එය පාලනය කළ යුතුය.

10 බලශක්ති අංශයට අදාළ **රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් ධනාත්මක බාහිරතා නිර්මාණය කරමින් ආර්ථික වර්ධනයේ නියමුවන්** ලෙස ක්‍රියා කල යුතු අතර, ආර්ථිකයේ **බලශක්ති සුරක්ෂිතභාවය** සහතික කෙරෙන ආකාරයේ **සියලු පැතිකඩ ආවරණය වන සැලැස්මක් බලශක්ති අංශය** සඳහා සකස් කිරීමට එම අංශයෙහි සියලුම පාර්ශ්වකරුවන් එක්ව ක්‍රියා කිරීමේ ඇඩි අවශ්‍යතාවක් පවතී.

11 **අපනයන කර්මාන්ත** වර්ධනය සහ විවිධාංගීකරණය කිරීමට උපාය මාර්ග සකස් කරන අතරම, වසංගත තත්ත්වය මගින් ඇති වූ අවදානම්වලට සහ ගෝලීය වෙළඳපොළ සහ භාණ්ඩ මිල ගණන්වලට බලපාන ගෝලීය ගැටලුවලට **ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාවය** ගොඩනඟා ගත යුතුය.

ගැටලු සහ ප්‍රතිපත්ති...

12 අත්‍යවශ්‍ය භාණ්ඩ රට තුළ පවත්වාගෙන යෑම සහතික කිරීමට, ආනයන ආදේශන කර්මාන්ත දියුණු කිරීමට සහ අපනයන ආදායම ඉහළ නැංවීමට, **වඩා ශක්තිමත් කාර්මික ප්‍රතිපත්ති සහ උපාය මාර්ග** අනුගමනය කිරීම අවශ්‍ය වේ.

13 **නිදහස් /වරණීය වෙළඳ ගිවිසුම්** මත දැඩි ලෙස පදනම් නොවී **අපනයන අංශ** සංවර්ධනය කල යුතුය.

14 **විදේශයන්හි උසස් අධ්‍යාපනය හැදෑරීම** සඳහා ඉහළ ගිය ඉල්ලුම සහ සැලකියයුතු ලෙස ඉහළ විදේශ විනිමය වියදම් තුළින් **දේශීය වශයෙන් පවතින උසස් අධ්‍යාපන අවස්ථා** සම්බන්ධ ගැටලු කඩිනමින් විසඳා ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි.

15 නිදහස ලැබීමෙන් පසුව **කෘෂිකාර්මික අංශයේ** පරිවර්තන සිදු වුවද, එම අංශයේ **සමස්ත ඵලදායිතාව** ඉහළ නැංවීම සඳහා ආහාර සුරක්ෂිතතාව සහ කාර්යක්ෂම පරිසර පද්ධති කළමනාකරණය සහතික කරමින්, එම අංශයේ සේවකයින්ට හිතකර මට්ටමේ ආදායම් උත්පාදනය කෙරෙන **තිරසාර කෘෂිකාර්මික අංශයක් නිර්මාණය කිරීමේ අඛණ්ඩ අරගලයක** ශ්‍රී ලංකාව පසුවේ.

ගැටලු සහ ප්‍රතිපත්ති...

16 ශ්‍රී ලංකාවේ **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර** ආර්ථිකය වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන අතර එම ව්‍යාපාර තවදුරටත් වර්ධනය වීම සඳහා වැඩි හැකියාවක් පැවතියද එම ව්‍යාපාර නොයෙකුත් බාධාවන්ට මුහුණ දෙන බැවින් ඒ සඳහා **ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා ක්‍රියාවට නැංවීම** අවශ්‍ය වේ.

17 ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබුණද, කොවිඩ්-19 වසංගතය විසින් තවදුරටත් උග්‍ර කර ඇති **අපද්‍රව්‍ය කළමණාකරන ගැටලු** මගින් ශ්‍රී ලංකාව අඛණ්ඩව දුෂ්කරතාවයට පත්ව සිටී.

18 ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් මනා ලෙස සංරක්ෂණය කිරීම ආර්ථිකයට **පරිසර පද්ධතියේ ඉහළම විභවතාව** ඇති කර ගැනීමට හැකිවන පරිදි ස්වභාවික සම්පත් යථා තත්ත්වයට පත් කිරීම සඳහා **"හරිත" සංවර්ධනය** කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් කාලීන අවශ්‍යතාවක් ලෙස පවතී.

19 තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ, 2030 වසර වනවිට **සියලු ආකාරයේ මන්දපෝෂණය තුරන් කිරීමේ** සිය ඉලක්කය සපුරා ගැනීම සඳහා රජය ප්‍රයත්න දැරුවද, **කොවිඩ් වසංගතය සහ කෘෂිකාර්මික භාණ්ඩ සම්බන්ධ මෑතකදී දක්නට ලද සැපයුම් අංශයේ කම්පන** නිසා වන බලපෑම් මගින් **රට මෙතෙක් අත්කර ගෙන ඇති ප්‍රගතියට තර්ජනයක් එල්ල විය හැකි අතර,** දිගු කාලීන සංවර්ධනය කෙරෙහිද බලපෑම් ඇති කළ හැකිය.

ගැටලු සහ ප්‍රතිපත්ති...

20 ශ්‍රම බලකායෙන් සැලකිය යුතු කොටසක් ආර්ථිකයේ වර්ධන හා සංවර්ධන ක්‍රියාවලියෙහි විෂය පථයෙන් පිටත රැඳී සිටින බව පසුගිය දශක තුනක කාලය පුරා **ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වයේ විශාල වර්ධනයක් නොතිබීම** තුළින් පෙන්නුම් කරන අතර, කොවිඩ්-19 වසංගතයේ බලපෑම්වලින් මිදී ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත් වීමට සහ **ඉහළ වර්ධන මාවතක් කර යොමු වීමට** දරන ප්‍රයත්නය හමුවේ ඒ පිළිබඳව **කඩිනම් අවධානයක්** යොමු කිරීම අවශ්‍යවන බව එමගින් අවධාරණය කරයි

මෙවැනි පසුබිමක් තුළ, ඉදිරියේදී ඇතිවිය හැකි අහිතකර ආර්ථික ප්‍රතිවිපාකවලට මුහුණ දෙමින් හදිසි අවස්ථාවන්ට අනුරූපීව ආර්ථිකය පවත්වාගෙන යෑම සඳහා රජය සහ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නය අවශ්‍ය වන අතර, විදේශීය අංශයේ සහ රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම පුනර්ජීවනය කිරීම සඳහා සහ ඉදිරියේදී සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා ව්‍යුහාත්මක ගැටලුවලට පිළියම් යෙදීම කඩිනම් ප්‍රමුඛතාවක්ව පවතී.

1. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන්වල වැදගත්කම
2. මැදි හා දිගු කාලීනව ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ස්ථායීතාව ළඟා කර ගැනීම
3. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය: සාර්ව ආර්ථික රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව සඳහා ගමන්මග
4. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික උත්තේජකයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ අභියෝග
5. ශ්‍රී ලංකාව පශ්චාත් වසංගත යථා තත්ත්වයට පත්වීමේ කාල සීමාව තුළ සංචාරක කර්මාන්තයේ භූමිකාව
6. අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම මඟින් රටක මූල්‍ය වෙළඳපොළට සහ ආර්ථිකයට ඇති කරන බලපෑම
7. ආර්ථික වර්ධනයට සහය සපයන්නන් ලෙස රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම
8. මෑත කාලීන ගෝලීය උද්ධමන තත්ත්ව පිළිබඳ සමාලෝචනය
9. කොවිඩ්-19 සහන සහ ණය පමාකාලයන්: අභියෝගයන් සහ ඉදිරි දැක්ම
10. ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය: උසස් ජීවන තත්ත්වය උදෙසා උසස් ගුණාත්මකභාවයෙන් යුතු මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති කිරීම
11. මූල්‍ය තාක්ෂණයේ (Fintech) ආක්‍රමණය: බැංකු අධීක්ෂකවරුන් සඳහා ඉදිරි මග
12. ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග: 2021

ස්තූතියි

වි.ස.01 ජාත්‍යන්තර මූල්‍ය (ජා.මූ.) අරමුදලේ වැඩසටහන්වල වැදගත්කම

- ජා.මූ. අරමුදල, ජාත්‍යන්තර සංචිත නැවත ගොඩ නැංවීම, විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම, ආනයන වියදම් සඳහා ගෙවීම් අඛණ්ඩව සහතික කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළුව මූලික ගැටලු නිරාකරණය කිරීම අරමුණු කර ගනිමින් ගෙවුම් තුලන ගැටලු අත්විඳින සාමාජික රටවලට සහය වීම සඳහා සිය වැඩසටහන් යටතේ ණය ලබා දෙයි.
- ජා.මූ. අරමුදලේ වැඩසටහනක අරමුණු, ප්‍රතිපත්ති සහ කොන්දේසි රඳා පවතින්නේ රටකට ආවේණික වූ ආර්ථික තත්ත්වයන් පදනම්ව ය.
- රටෙහි බලධාරීන්, ජා.මූ. අරමුදල සමඟ එකඟත්වය ඇතිකර ගන්නා වූ ප්‍රතිපත්තිමය බැඳීම්වලට පූර්ව ක්‍රියාවන්, ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක, දර්ශක ඉලක්ක සහ ව්‍යුහාත්මක මිණුම් දඬු ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව සහ ජා.මූ. අරමුදල අතර අතීතයේ සිට පවතින සබඳතාව

- 1950 වසරේ දී ජා.මූ. අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ වැඩසටහන් දහසයකට සහභාගී වී ඇත.
- ශ්‍රී ලංකාවට සම්පූර්ණ අරමුදල් ප්‍රතිපාදන ලබා දී තිබෙන වඩාත්ම සාර්ථකම වැඩසටහන 2009 වසරේ දී ආරම්භ කරන ලද සමීපස්ථ ණය පහසුකම විය.
- පෙර පැවති ජා.මූ. අරමුදලේ වැඩසටහන් මූලික වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ විදේශ සංචිත වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහිය.
- ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දීම, මහ බැංකුවේ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය සහ ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇතුළත් අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ද ක්‍රියාත්මක විය.
- 2016 වසරේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගෙන් පසුව රාජ්‍ය ආදායම් සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවට රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ නමුත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත
- 2009 වසරේ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක, ශුද්ධ දේශීය මූල්‍යකරණය, සංචිත මුදල් දර්ශක ඉලක්ක සහ එක් ව්‍යුහාත්මක මිනුම් දඬුවක් හැර අනෙකුත් මිනුම් දඬු සියල්ල සපුරා ඇත.
- ජා.මූ. අරමුදල විසින් ශ්‍රී ලංකාවට බොහෝ තාක්ෂණික සහායන් ද ලබා දී ඇත
- බොහෝ වැඩසටහන්වලට සහභාගී වුව ද, බලධාරීන් විසින් ශ්‍රී ලංකාව තුළ සාර්ථකව ක්‍රියාත්මක කර ඇත්තේ වැඩසටහන් කිහිපයක් පමණි.
- මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විශේෂයෙන්ම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවලට අදාළව කොන්දේසි සපුරාලීමට අවශ්‍ය කැපවීමේ දුර්වලතාවයයි.

ජා.මූ. අරමුදල සමඟ අනාගත වැඩසටහනකින් ශ්‍රී ලංකාවට ඇති බලපෑම්

- වත්මන් පසුබිම තුළ, අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් ජය ගැනීම සඳහා ජා.මූ.අ. වැඩසටහනක් වැදගත් වනු ඇත.
- වර්තමානයේ පවතින පහළ විදේශ සංචිත මට්ටම හේතුවෙන් සැලකිය යුතු ඉහළ ණය සේවාකරණය කිරීම අතිශයින් අභියෝගාත්මක වනු ඇත.
- ජා.මූ. අරමුදලේ වැඩසටහනකට ඇතුළත් වීම තුළින් අමතර මූල්‍යකරණය සඳහා ප්‍රවේශය ලබා දීම සහ ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කරයි.
- සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීම තුළින් සමස්ත සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් ණය නොවන මූල්‍ය ලැබීම් ප්‍රවර්ධනය කෙරෙනු ඇත.
- අනාගතයේ ජා.මූ. අරමුදලේ වැඩසටහනක් තුළදී ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් අතරට රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීභාවය, රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය ක්‍රමානුකූලව අඩු කිරීම, රජය සතු වාණිජ ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම යනාදිය ඇතුළත් වේ.
- සාර්ව ආර්ථික ස්ථායීකරණ පියවරයන් ආර්ථිකයට අසීරු වෙනස්කම් සිදු කළ හැකි නමුත් වත්මන් ආර්ථික අර්බුදය සලකා බැලීමේ දී ඒවා අත්‍යවශ්‍ය වී ඇත.
- සුදුසු ක්‍රියාමාර්ග හරහා තිරසාර ලෙස විදේශීය ණය කළමණාකරණය කිරීම ශ්‍රී ලංකාව විසින් සහතික කළ යුතුය.
- ණය වගකීම් ක්‍රමානුකූලව සහ එකඟතාවයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා, විදේශීය ණය සේවාකරණය කිරීම තාවකාලිකව අත්හිටුවන බව රජය දැනටමත් නිවේදනය කර ඇත.
- තවද, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථක ලෙස සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන හා සමාජ ස්ථාවරත්වයක් ළඟා කර ගත යුතුය.

වි.ස.02 මැදි හා දිගු කාලීනව ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ස්ථායීතාවය ළඟා කර ගැනීම

- ගෝලීය ආර්ථිකයේ අහිතකර වර්ධනයන් සහ කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ බලපෑම් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මෑත වසරවල පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දෙමින් සිටියි.
- තිරසාර විදේශීය ණය තත්ත්වයකින් සහ කළමනාකරණය කළ හැකි ජංගම ගිණුම් හිඟයකින් සමන්විත වන, විදේශීය අංශයේ දිගුකාලීන ස්ථායීතාවය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

විදේශීය අංශය: වත්මන් තත්ත්වය සහ ගැටලු

1. අඛණ්ඩව ඉහළ යන ජංගම ගිණුමේ හිඟයන්
2. පාස්කු ඉරු දින ප්‍රහාර සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජංගම ගිණුමට ඇති වූ අහිතකර බලපෑම්
3. මූල්‍ය ගිණුමේ දුර්වල කාර්ය සාධනය
4. විදේශීය ණය මට්ටම ඉහළ යෑම
5. විදේශීය ණය සේවාකරණ ගෙවීම්
6. දළ නිල සංචිත පහත වැටීම
7. විනිමය අනුපාතිකය මත ඇති වූ සැළකිය යුතු පීඩනය

ස්ථායීතාවය නැවත ඇති කරගැනීම සඳහා වූ කෙටිකාලීන ක්‍රියාමාර්ග

අ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීමට සහ සංචිත ගොඩනැගීමට

ආ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වැඩි කිරීමට

ඇ. විදේශ මූල්‍ය ආධාර සුරක්ෂිත කිරීමට

මහ බැංකුව සහ රජය ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.

මැදි කාලීන ක්‍රියාමාර්ග

1. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබන ආර්ථික ගැලපුම් වැඩසටහනකට අනුකූලව පුළුල් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
2. විදේශීය ණය තිරසාර බව සහතික කිරීමේ අවශ්‍යතාවය
3. දළ නිල සංචිත යහපත් මට්ටමක පවත්වාගෙන යෑම
4. කලාපීය සහයෝගීතාව ශක්තිමත් කිරීම

දිගු කාලීන ක්‍රියාමාර්ග

1. ණය නොවන විදේශ විනිමය ලැබීම් ශක්තිමත් කිරීම
   - අ. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන අංශ ප්‍රවර්ධනය කිරීම
   - ආ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීම
   - ඇ. විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම

වි.ස.03 රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය : සාර්ව ආර්ථික රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව සඳහා ගමන්මග

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අංශය වසංගතය නිසා දැඩි බලපෑමකට ලක් වුව ද, වත්මන් දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වී තිබෙන සාර්ව ආර්ථික ගැටලු සම්පූර්ණයෙන් ම වසංගත තත්ත්වය හේතුවෙන් පමණක් නිර්මාණය වී නොමැති අතර, එම ගැටලු රාජ්‍ය මූල්‍ය අංශයෙහි දිගු කාලයක සිට පවතින සහ නොවිසඳුනු ගැටලුවල පිළිබිඹුවක් වේ.

දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් නිසා හට ගන්නා අහිතකර සාර්ව ආර්ථික අසමතුලිතතා නිසාවෙන්, විශේෂයෙන් ම මැදි කාලීනව සිට දිගු කාලීනව දක්වා සාර්ව ආර්ථික ස්ථායීතාව තහවුරු කර ගැනීම සඳහා, මැනවින් සැලසුම් කරන ලද රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලාංකික ආර්ථිකයට බෙහෙවින් ඵලදායී වනු ඇත

ඉදිරි ගමන්මග

- රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රතිපත්ති මාලාව 'ආර්ථික වර්ධන හිතකාමී' ආකාරයකින් සැලසුම් කිරීම සඳහා ප්‍රමාණාත්මකව කුඩා රාජ්‍ය මූල්‍ය ගුණකයන් සහිත රාජ්‍ය මූල්‍ය උපකරණ භාවිත කිරීම
- වැට් බදු පදනම පුළුල් කිරීම, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු/ පුද්ගලික ආදායම් බදු අනුපාත වැඩි කිරීම සහ බදු පරිපාලනය සහ බදු අය කිරීම් බලාත්මක කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
- රජයේ නව බඳවා ගැනීම් සහ වැටුප් සංශෝධනවල දී දූරදර්ශීව කටයුතු කිරීම සහ සහනාධාර වැඩසටහන් වඩා හොඳින් ඉලක්කගත කිරීම
- පොදුවේ සෑම අංශයකින් ම වියදම් කප්පාදු කිරීමක් සිදු කිරීම වෙනුවට, 'මුදල සඳහා වැඩි අගයක්' ලබා දෙන ක්‍රමෝපායයන් ඔස්සේ සැලකිය යුතු ලෙස ප්‍රාග්ධන වියදම් කපා හැරීම
- ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කරන ආයෝජන සහ දිගු කලක සිට ක්‍රියාවට නැංවීමට නියමිත, එහෙත් ක්‍රියාත්මක නොකෙරුණු, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම → පිරිවැය පිළිබිඹු කරන මිලකරණ යාන්ත්‍රණ, කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම් සහ වෙළඳපොළ මත පදනම් වූ නිෂ්පාදන සහ සේවා සැපයීම් වැනි රාජ්‍ය ව්‍යවසායයන්ට අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම
- රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවෙහි ප්‍රගතිය අධීක්ෂණය සඳහා නීතිමය සහ පරිපාලනමය වශයෙන් ප්‍රතිසංස්කරණ සිදු කිරීම

වි.ස.04 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික උත්තේජකයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ අභියෝග

- ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල ආයතන සඳහා පදනම සපයන මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, එවැනි විශාල ආයතන හරහා සැපයුම් දාම ප්‍රසාරණය වීම ඔස්සේ ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කරයි
- ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර, ජනගහනයේ විශාල කොටසකට රැකියා අවස්ථා සපයයි. එමගින් මහජනයාගේ ජෛවීමේ ශක්තිය වැඩි කිරීම සඳහා සහාය වන අතර පරිභෝජනය ඉහළ නැංවීම සහ සමස්ත ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීම සිදු කරයි
- ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර, සියලුම ආකාරයේ සමාජ සමූහයන් පුරා විහිදී පැවතෙමින් අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා බෙහෙවින් දායකත්වය සපයන අතර එමගින් ආදායම් ව්‍යාප්තියෙහි අසමානතා අවම කිරීමට දායක වේ
- ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ඒවායෙහි අදාළ ව්‍යාපාරික පරිසරයන් තුළ තරගකාරීත්වය ඉහළ නැංවිය හැකි අතර නවෝත්පාදන අදහස් දිරිමත් කළ හැකිය
- තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේදී වැදගත් කාර්යභාරයක් ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර ඉටු කරන අතර, එමගින් ආයෝජක විශ්වාසය වැඩිදියුණු කිරීම හරහා ආර්ථිකයන්ට සහය ලබා දීම සඳහා වක්‍ර භූමිකාවක් ද ඉටු කරයි
- කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට යම්තාක් ප්‍රමාණයකට ආර්ථිකයක ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කළ හැකිය

ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ විශාල ව්‍යාපාරවල මධ්‍යස්ථ ප්‍රතිශත (%)



- *සීමිත මූල්‍ය ප්‍රවේශය*
- *සීමිත ව්‍යාපාර කුසලතා සහ මානව සම්පත් රඳවා ගැනීමට නොහැකි වීම*
- *නියාමන බාධක සහ එකිනෙක නොගැළපෙන ප්‍රතිපත්ති*
- *අඩු වෙළඳපොළ කොටස සහ වෙළඳපොල වෙත පවතින සීමිත ප්‍රවේශය*
- *ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර පිලිබඳ තොරතුරු සහ දත්තවල හිඟය*
- *වසංගතයේ හා අනෙකුත් ප්‍රවණතාවන්හි බලපෑම*
- *ස්ත්‍රී-පුරුෂ භාවය මත පවතින අසමානතා*

- *මූල්‍යන දුෂ්කරතා සඳහා පිළියම් යෙදීම*
  - *ණය ඇප ආවරණ යෝජනා ක්‍රම*
  - *සංවර්ධන බැංකු*
  - *ප්‍රතිපත්ති මත පදනම් වූ ණය ලබා දීම් විකල්ප මූල්‍යන ක්‍රම*
  - *...*
- *ජයග්‍රාහකයන්ට සහාය ලබා දීම*
- *සමූහගත කිරීම සහ සම්බන්ධතා වැඩි දියුණු කිරීම*
- *ඉලක්කගත සහාය*
  - *ප්‍රමුඛතාකරණය*
  - *තොරතුරු තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය*
  - *...*

ක්‍රමෝපායන්

වි.ස.05 ශ්‍රී ලංකාව පශ්චාත් වසංගත යථා තත්ත්වයට පත්වීමේ කාල සීමාව තුළ සංචාරක කර්මාන්තයේ භූමිකාව

- යෙදවුම් සඳහා විදේශ විනිමය පිටතට ගලා යෑම ඉතා අවම වන නිසා සංචාරක කර්මාන්තය ශුද්ධ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස පවතී. එසේම, සංචාරක කර්මාන්තය ආර්ථික වර්ධනයට,සේවා නියුක්තියට සහ කලාපීය ආදායම් විෂමතා අවම කිරීමට ද දායක වේ.
- සංචාරක කර්මාන්තය, 2014 සහ 2019 කාලපරිච්ඡේදය තුළ විදේශ විනිමය ඉපැයීමේ තෙවන විශාලතම මූලාශ්‍රය වූ අතර, 2018 වසර දක්වා ස්ථාවර ලෙස වර්ධනය විය.
- 2018 වසරේ දී, ඇඟලුම් අපනයන ඉපැයීම්වලින් රෙදිපිළි ආනයන වියදම් අඩු කළ විට ලැබෙන ශුද්ධ ඇඟලුම්, තේ, රබර් නිෂ්පාදිත වැනි අපනයනයන්ට වඩා වැඩි ආදායමක් සංචාරක කර්මාන්තය මඟින් උපයා ඇත. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක කර්මාන්තයේ ඉපැයීම්වලට වඩා වැඩි වූ නමුත්, පහළ ගොස් ඇත.
- දිගින් දිගටම පවතින වෙළඳ හිඟයන් සහ විශාල විදේශ විනිමය ණය බර නිසා වර්තමානයේ විදේශීය අංශය මත ඇති පීඩනය හේතුවෙන්, ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා සංචාරක කර්මාන්තයට ප්‍රධාන කාර්යයභාරයක් පැවරී ඇත.

- ගෝලීය සංචාරක කර්මාන්තය, 2019 වසර දක්වා ස්ථාවර ලෙස වර්ධනය විය.
- සංචාරක කර්මාන්තය, 2024 වසරේ දී 2019 වසරේ පැවති මට්ටම දක්වා ඉහළ යනු ඇත.
- සංචාරය කිරීමට ඇති දැඩි ආශාව සහ පුද්ගල ඉතිරිකිරීම් සැලකිය යුතු ප්‍රමාණයක් වියදම් කිරීමට ඇති සූදානම
- සාර්ව ආර්ථික ගැටලු පවතින කුඩා රටවල් සංචාරක කර්මාන්තය මත බෙහෙවින් රඳා පවතී - එක්සත් ජාතීන්ගේ මූල්‍ය අරමුදල

'නව සාමාන්‍ය' තත්ත්වය තුළ සංචාරක කර්මාන්තය

- සෞඛ්‍ය හා සනීපාරක්ෂක ක්‍රියාමාර්ගවල වැදගත්කම
- ඉහළ සනත්ව සංචාරක කර්මාන්තය වෙනුවට සමාජීය වශයෙන් දුරස්ථ සංචාරක කර්මාන්තය
- බොහෝ සංචාරකයින් X සහ Y පරම්පරාවට (තරුණයින්) අයත් වේ.
- රැඳී සිටීමේ කාලය සහ වියදම් වැඩි වී ඇත
- අවසාන මොහොතේ වෙන් කිරීම් සහ අවලංගු කිරීම්
- ඩිජිටල් නොමැඩිකරණය (තැනින් තැනට යමින් ඩිජිටල් තාක්ෂණය හරහා වැඩ කිරීම) සහ සංචාරක ස්ථානවල දිගුකල් ගත කිරීම
- පුද්ගලික සුවතාවයේ සහ මානසික සෞඛ්‍ය පිළිබඳ උනන්දුව
- ස්වභාවික පරිසරය කෙරෙහි වැඩි සැලකිල්ල

ඉදිරි දැක්ම

සංචාරක ප්‍රතිපත්තිය, කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. 2022-2025 උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම පවතින අතර පහත ක්‍රියාමාර්ග කෙරෙහි ද තවදුරටත් අවධාරණය කිරීම අවශ්‍ය වේ,

- සංචාරක කර්මාන්තයේ නව අවස්ථා හඳුනා ගැනීම– අධ්‍යාපනය, පුද්ගල සුවතාවය, පරාර්ථකාමී කටයුතු
- ස්වභාවධර්මය සංරක්ෂණය කිරීම– දර්ශනීය ස්ථාන සහ රක්ෂිත ප්‍රදේශවල ඉදිකිරීම්, ශබ්ද දූෂණය, සත්ත්ව ආරක්ෂණය ආදිය
- සංචාරකයාගේ ගමන් මග සහ ඔවුන්ගේ ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම
- ඩිජිටල් තාක්ෂණය වැඩි වශයෙන් භාවිත කිරීම– තොරතුරු සැපයීම, සංචාරකයින් අඩුවෙන් සංචාරය කළ ස්ථාන වෙත යොමු කිරීම, සම්බන්ධතා රහිත ගෙවීම් ක්‍රමවේද ආදිය
- තොරතුරු ජාලය වැඩිදියුණු කිරීම– සංචාරක සැටලයිට් ගිණුම්කරණය සහ සංචාරක ආයතනයන්හි වෙළඳපොළ පර්යේෂණ හැකියාවන්
- මූල්‍ය ආයතන මත සංචාරක කර්මාන්තයේ බලපෑම කළමනාකරණය කිරීම
- සංචාරක අංශය තුළ අවිධිමත් බව අඩු කිරීම
- සංචාරකයින් අතර විවිධත්වය දිරිමත් කිරීම
- අපනයන විවිධාංගීකරණය කර සංචාරක කර්මාන්තය මත රඳා පැවතීම ක්‍රමයෙන් අඩු කිරීම

වි.ස.06 අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම මගින් රටක මූල්‍ය වෙළඳපොළට සහ ආර්ථිකයට ඇති කරන බලපෑම

- අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම, විවිධ රටවල මුදල් හුවමාරු කිරීමේ සේවාවන් සැපයීම සඳහා බලපත්‍ර නොමැති හවාලා, හුන්ඩි හෝ උන්ඩියල් වැනි නියාමනයට ලක් නොකෙරෙන වෙළඳපොළ සේවා සපයන්නන්ගෙන් සමන්විත වේ.
- නියාමන රාමුවක් නොමැතිකම, අරමුදල් උපයාගත් මූලාශ්‍රය සහ භාවිතය කෙරෙහි අවධානය යොමු නොවීම සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට අපහසු වීම හේතුවෙන් මුදල් විශුද්ධිකරණයෙහි නියැළෙන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් විසින් හවාලා / උන්ඩියල් අනිසි ලෙස භාවිතයට බෙහෙවින් ඉඩකඩ පවතී.
- එබැවින්, රටක මූල්‍ය පද්ධතියෙහි සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වයට මෙම ක්‍රම අහිතකර ලෙස බලපෑ හැකිය. විශේෂ සටහනේ සාකච්ඡා කර ඇති ඇතැම් බලපෑම් පහත පරිදි වේ:

ආර්ථිකය මත හවාලා/උන්ඩියල් ඇති කරන බලපෑම

- බදු ආදායම අඩු වීම
- අඩු තක්සේරු කර ඇති ගෙවුම් ශේෂය
- විදේශ සංචිත අඩු වීම
- මුදලට ඇති ඉල්ලුමේ අස්ථාවරත්වය
- අකාර්යක්ෂම මුදල් ප්‍රතිපත්තිය
- බැංකු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සීමා වීම
- ජාතික ආරක්ෂාවට තර්ජන එල්ල වීම

- පසුගිය කාලය තුළ ශ්‍රී ලංකා වෙළෙඳපොළේ එවැනි ක්‍රියාකාරකම් ව්‍යාප්ත වීම සහ ආර්ථිකයට ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින් මහ බැංකුව විසින් පහත පියවර ගෙන ඇත.
  - පුවත්පත්, රූපවාහිනිය වැනි විවිධ මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් (සාකච්ඡා, පොදු නිවේදන, දැන්වීම්, ලිපි) පැවැත්වීම
  - නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් විසින් අරමුදල් මූලාශ්‍රය විමර්ශනය කරන තුරු හවාලා/උන්ඩියල් ගනුදෙනුවලින් ලැබෙන අරමුදල් ගනුදෙනු සඳහා යොදා ගැනීමේ හැකියාව අත්හිටුවීම
  - විදේශීය ශ්‍රමිකයින් ඔවුන්ගේ ඉපැයීම් විධිමත් ක්‍රම හරහා ප්‍රේෂණය කිරීම දිරිගැන්වීම සඳහා මූල්‍ය දිරිගැන්වීම් හඳුන්වා දීම
- ජාත්‍යන්තර අත්දැකීම් අනුව; බලපත්‍ර නොමැතිව මෙම ක්‍රියාකාරකම්වල නියැලීම සීමා කිරීම, ජාත්‍යන්තර මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවශ්‍යතාවලට අනුකූලව නීතිමය ප්‍රඥප්ති හරහා ලියාපදිංචිය සඳහා අවශ්‍යතා පැනවීම සහ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ විධිමත් බැංකු ක්‍රම විශේෂයෙන්, ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම හවාලා වැනි අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමවලින් ආර්ථිකයට සිදුවන අහිතකර බලපෑම් පාලනය කිරීමට ගෙන ඇති පියවර වේ.
- ශ්‍රී ලංකාව තුළ හඳුනාගෙන ඇති හවාලා වර්ගයේ පද්ධති විධිමත් කිරීම සඳහා සුදුසු නීතිමය රාමුවක් හඳුන්වාදීම අවශ්‍ය වන අතර බලධාරීන් මේ සඳහා කටයුතු සම්පාදනය කරමින් සිටී.

ආර්ථික වර්ධනයට සහාය සපයන්නන් ලෙස රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම

පසුගිය දශක තුන පුරාවට, බලයට පත් වූ රජයන් පුද්ගලීකරණය කිරීම සහ ජනසතු කිරීම යන ප්‍රතිපත්ති අතර දෝලනය විය.

වර්තමානයේදී, විදුලිබල, බලශක්ති, මූල්‍ය හා රක්ෂණ,ජලය, ගුවන් සේවා, සෞඛ්‍ය සහ අධ්‍යාපනය ඇතුළු අංශ කිහිපයක

රාජ්‍ය ව්‍යවසායයන් 400කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ

රාජ්‍ය ව්‍යවසායයන් මගින් නිර්මාණය කර ඇති සැලකිය යුතු සාර්ව ආර්ථික බලපෑම් සමඟ රාජ්‍ය අංශය මත ඉහළ පීඩනයක් ඇති කර ඇත



වි.ස.08 මෑත කාලීන ගෝලීය උද්ධමන තත්ත්ව පිළිබඳව සමාලෝචනය

- සාධක ගණනාවක් හේතු කොටගෙන ගෝලීයව මෙන්ම දේශීයව උද්ධමනයෙහි ඉහළ යෑම් දක්නට ලැබුණද, උද්ධමනය සාමාන්‍යයෙන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.
- එවැනි උද්ධමනයෙහි දක්නට ලද ඉහළ යෑම් සඳහා මුල් වූ සාධක අතර, ප්‍රධාන වශයෙන් තෙල් සහ අහාර ඇතුළු භාණ්ඩ මිල ඉහළ යාම, දේශීයව මිල පාලනයන් ඉවත් කිරීම,සැපයුම් හිඟය හා ඉල්ලුම ඉහළ යාම මෙන්ම ප්‍රතිපත්තිමය දෝෂ සහ කොවිඩ්-19 හේතුවෙන් සැපයුම් දාමයට වූ අවහිරතා ප්‍රධාන වේ
- ජනප්‍රිය දේශපාලන සංස්කෘතිය, ඉහළ අයවැය හිඟයන් හා මහා බැංකු මගින් එම හිඟයන් මුල්‍යනය කිරීම,ඉහළ රජයේ වියදම්, ඉහළ යුධ වියදම්, අඩු ඵලදායිතාව, නිරන්තරයෙන් සිදුවන දේශගුණික කම්පන, දිගින් දිගටම පවතින ආර්ථික නියෝජිතයන්ගේ ඉහළ උද්ධමන අපේක්ෂා,අධි මුදල් සැපයුම සහ තිරසාර නොවන විනිමය අනුපාතික හේතුවෙන්, ඉහළ උද්ධමන තත්ත්වයන් දියුණු රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින හා නැඟී එන ආර්ථිකවල වැඩි කාලයක් පුරා පවතී.
- ඉහළ උද්ධමනකාරී තත්ත්වයන්ට විසඳුම් ලබාදෙන ප්‍රතිපත්ති ප්‍රතිචාර අතරට, රජයේ සුදුසු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සමඟ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම, මිල පාලනයන් සහ සහනාධාර, විනිවිදභාවයෙන් යුතු සහ ස්වාධීන මහබැංකු කටයුතු,මුදල් ආධාර වැනි ආරක්ෂණ ජාල මැදිහත්වීම් සහ රාජ්‍ය මූල්‍ය නීති වැනි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම ඇතුළත් වේ .



මූලය: Ha, J. M. et al. (2021)


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

වි.ස.09 කොවිඩ්-19 සහන සහ ණය පමා කාලයන්: අභියෝගයන් සහ ඉදිරි දැක්ම

①	②	③
හඳුන්වා දීම	**ශ්‍රී ලංකා මහ බැංකුව අනෙකුත් මහ බැංකු විසින් ලබා දුන් සහන**	**මූල්‍ය ආයතනවලට ඇති අභියෝග**
• කොවිඩ්-19 වසංගතය නිසා ශ්‍රී ලංකාව සහ ලොව පුරා ආර්ථිකයන් මුහුණ දෙන අභියෝග සහ දුෂ්කරතා	• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ සහන පැකේජ • ණය සහන කාලයෙන් ඔබ්බෙ ඇති සහන • අනෙකුත් මහ බැංකු විසින් හඳුන්වා දෙනු ලැබූ සහන පැකේජ • පොලී අනුපාතවල අවශ්‍යතාව කුමක් ද? පොලී අනුපාතය බින්දුව යටතේ ණය සහන හඳුන්වා දිය හැකි ද?	• අක්‍රීය ණය වැඩි වීම සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක මත ඇතිවන බලපෑම • ද්‍රවශීලතාවය පවත්වා ගැනීම් සහ ණය ආපසු ගෙවීමේ වගකීම් ගරු කිරීම • සීමිත සම්පත් කළමනාකරණය සහ අත්‍යවශ්‍ය සේවා ලබා දීම • ව්‍යාපාර සැලසුම් වෙනස් කිරීම, උපායමාර්ගික දිශානතිය සහ ප්‍රමුඛතා නැවත සකස් කිරීම

④	⑤	⑥
ණය සහන ඉවත් කිරීම	**ණය සහනවලින් ඔබ්බෙ ඇත්තේ කුමක් ද?**	**ඉදිරි මග** **සැමට ප්‍රතිලාභ ලැබෙන, තිරසාර පුනර්ජීවනය සහ වර්ධනය සඳහා වූ අපේක්ෂා**
• නිසි කලට පෙර හෝ පමා වී හෝ ණය සහන ඉවත් කිරීම හානිකර වන්නේ ඇයි? • ණය සහන ඉවත් කිරීමේ දී, මෙම කරුණු දෙක අතර සමබරතාවක් ඇති කර ගන්නේ සහ සියලු පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා කළමනාකරණය කරන්නේ කෙසේ ද?	• නව සාමාන්‍ය තත්ත්වය යටතේ දී මුදල් ප්‍රවාහ සහ ව්‍යාපාර ශක්‍යතා සලකා බලා ණය ප්‍රතිව්‍යුහගත කිරීම • ව්‍යාපාරවලට (ණය ලබා ගන්නන්ට) සහ බැංකුවලට (ණය ලබා දෙන්නන්ට) තම ව්‍යාපාර ආකෘතීන් පිළිබඳව යළි සිතා බැලීමට උනන්දු කිරීම - නව ව්‍යාපාර අවස්ථා, කාර්යක්ෂමතාව වර්ධනය, ප්‍රාග්ධනය අලුතින් යෙදවීම, විකල්ප/ අඩු වියදම් ක්‍රම • ශක්‍යතාවය සහිත ආයතනවලට යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රාග්ධනය යෙදවීම්	• වසංගතයෙන් උගත් පාඩම් පිළිබඳව සලකා බැලීම සහ ව්‍යාපාර වඩාත් තිරසාර කිරීම සඳහා දිගු කාලයක සිට සිදු කළ යුතුව තිබූ ප්‍රතිසංස්කරණ සිදු කිරීමට වසංගතය අවස්ථාවක් කර ගැනීම • මිනිසා විසින් නිර්මාණය කළ සහ ස්වභාවික ව්‍යසනයන්ට මුහුණ දීමට මූල්‍ය අංශය සහ ණය ගැණුම්කරුවන් සූදානම් කිරීම සහ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම • පශ්චාත් වසංගත කාලය තුළ සැමට ප්‍රතිලාභ ලැබෙන සේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා ප්‍රාදේශීය, ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන, කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන, හරිත සහ සමාජ ව්‍යවසායයන්ට සහය වීම

වි.ස.10 ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය: උසස් ජීවන තත්ත්වයක් උදෙසා උසස් ගුණාත්මකභාවයෙන් යුතු මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති කිරීම

- ශ්‍රී ලංකාවේ සියලු පුද්ගලයින් සහ ව්‍යවසායයන්ට තම ජීවන මට්ටම ඉහළ නංවා ගනිමින්, ආර්ථික වර්ධනය සඳහා දායක විය හැකි ඉහළ ගුණාත්මකභාවයකින් යුතු, වඩාත් සුදුසු, ආරක්ෂිත සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන හා සේවා වෙත දැනුම්වත්, සාධාරණ සහ සමානාත්මතාවයෙන් යුතු ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රථම වරට සියලුම පාර්ශවකරුවන්ට දිගු කාලීන, විස්තීරණ සහ මනා සම්බන්ධීකරණයකින් යුතු වූ ප්‍රවේශයක් ලබා දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ මාර්තු මාසයේ දී මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය දියත් කරන ලදී.

ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්ෂේත්‍ර

- ඩිජිටල් මූල්‍ය සහ ගෙවීම්
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍ය
- පාරිභෝගික ආරක්ෂණය
- මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා සංවර්ධනය

අරමුණු

- රට තුළ මනාව ස්ථාපිත ඩිජිටල් මූල්‍ය සහ ගෙවීම් පද්ධතියක පැවැත්ම
- සුදුසු සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන සහ සේවා වෙත ප්‍රවේශ වීමේදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මුහුණ දෙන බාධා ඉවත් කිරීම
- මනා ලෙස සැලසුම් කළ නියාමන රාමු සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා මූල්‍ය නිෂ්පාදන සහ සේවා භාවිතය
- මූල්‍ය නිෂ්පාදන සහ සේවා ලබා ගැනීම සහ භාවිතය ඉහළ නැංවීම සඳහා පුද්ගලයන් සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අතර ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම

අපේක්ෂිත බලපෑම

- පිරිවැය කාර්යක්ෂමතාවකින් සහ ශක්‍යතාවයකින් යුතු ඩිජිටල් මූල්‍ය සේවා බෙදා හැරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය වඩාත් හිතකර නියාමන පරිසරයක් සහ ඩිජිටල් යටිතල පහසුකම්
- ආදායම් උත්පාදනය සහ වඩාත් විධිමත් රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වලට වඩාත් ඵලදායී වීමට අවශ්‍ය මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රවේශය වැඩි කිරීම
- ගනුදෙනුකරුවන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙළඳපොළ හැසිරීම ශක්තිමත් කිරීම
- අනාගත ශ්‍රී ලාංකිකයන් සිය මූලික මූල්‍ය අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සඳහා පාරිභෝගිකයින්ගේ නිවැරදි මූල්‍ය දැනුම, කුසලතා සහ හැසිරීම පුළුල් කිරීම

මූල්‍ය තාක්ෂණයේ (Fintech) ආක්‍රමණය : බැංකු අධීක්ෂකවරුන් සඳහා ඉදිරි මග

①	②
හැඳින්වීම	**සාම්ප්‍රදායික බැංකුකරණයට බලපාන මූල්‍ය තාක්ෂණ නවෝත්පාදනයන්**
• සාම්ප්‍රදායික බැංකුකරණයට අභියෝගකරුවෙකු ලෙස මූල්‍ය තාක්ෂණයේ නැගී සිටීම ඉහළ තරඟකාරීත්වය, ඉහළ කාර්යක්ෂමතාවය සහ අතරමැදි පිරිවැය අඩු වීම සඳහා ඉඩ සලසයි. • තාක්ෂණය, දත්ත පාලනය සහ වෙළඳපොළ හැසිරීම සම්බන්ධ අවදානම් ඇති කිරීම; සහ බැංකු අධීක්ෂකවරුන් නවීන තාක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීමේ අවශ්‍යතාව	• විවෘත බැංකුකරණය (තෙවන පාර්ශ්වීය වේදිකාවන් හරහා බැංකුකරණය පුළුල් කිරීම), අතථ්‍ය බැංකුකරණය (ශාඛා රහිත බැංකුකරණය), සහ ඩිජිටල් මුදල් • විවෘත එහෙත් ප්‍රවේශම් සහගත නියාමන ප්‍රවේශයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය සහ අධීක්ෂණවරුන් අධීක්ෂණ තාක්ෂණය භාවිත කිරීමේ අවශ්‍යතාවය
③	④
බැංකු අධීක්ෂකවරුන් සඳහා වන අධීක්ෂණ තාක්ෂණ හැකියාවන්	**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් ගෙන ඇති පියවරයන්**
• අධීක්ෂණ තොරතුරු පද්ධති, උසස් දත්ත විශ්ලේෂණ පදනම් වූ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා, විෂමාචාර සහ මූල්‍ය අපරාධ හඳුනාගැනීමේ නිරීක්ෂණ හැකියාව, සහ පොදු සහ පොදු නොවන ව්‍යුහගත නොවන දත්තවලින් අධීක්ෂණය පිළිබඳ තීක්ෂ්ණ දැක්මක් ලබා දීමට කෘතිම බුද්ධිය භාවිත කිරීම	• තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව, නියාමන පරීක්ෂණ අවකාශ රාමුව, සහ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC data sharing) දත්ත හුවමාරුව පිළිබඳ සංකල්පය සනාථ කිරීම (Proof of concept).